# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1360 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 30/10/2023<br>පැය 1210 |

# මාධ්‍ය නිවේදනය

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2023.10.29 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ වඩුගොඩවත්ත ප්‍රදේශයේදී කොළඹ අපාරධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 16 මිලිග්‍රෑම් 420 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 31 ක් වන වඩුගොඩවත්ත, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 02. බාල වයස්කාර දරුවෙකුට පහරදීමක් - කාත්තන්කුඩි පොලිස් වසම.

2023.10.28 වන දින රාත්‍රී කාලයේ කාත්තන්කුඩි පොලිස් වසමේ කාත්තන්කුඩි 06 ප්‍රදේශයේ පිහිටි පල්ලියක ඉගෙනීමේ කටයුතු සඳහා ගිය වයස අවුරුදු 08 ක දරුවෙකුට එම පල්ලියේ මව්ලව්වරයෙකු පොල්ලකින් පහරදී ඇති බවට කාත්තන්කුඩි පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත. පහරදුන් මව්ලව්වරයා අත්අඩංගුවට ගෙන ඇති අතර තුවාල ලැබූ බාල වයස්කාර දරුවා කාත්තන්කුඩි රෝහල වෙත ඇතුලත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහලට ඇතුලත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන කාත්තන්කුඩි 06 ප්‍රදේශයේ පදිංචි මව්ලව්වරයෙකි.**

ඉගෙනීමේ කටයුතු සඳහා පැමිණි දරුවා හට පාඩම් කිරීමට පවරන ලද පාඩම් කට පාඩම් නොමැති වීම හේතුවෙන් මෙලෙස පහර දී ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 03. අපරාධයකට අවශ්‍යකර සිටි සැකකාරියක් අත්අඩංගුවට - වව්නියාව පොලිස් ස්ථානය

2023.10.22 වන දින වව්නියාව පොලිස් වසමේ දී ආයතනයක සේවිකාවක වශයෙන් සිට රු.1,422,000/- ක් වටිනා පවුම් 09 ක් බර රන් භාණ්ඩ සොරා ගැනීමක් සම්බන්ධයෙන් වව්නියාව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශනයක් ආරම්භ කර තිබිණි. ඒ අනුව සිද්ධියට සම්බන්ධ සැකකාරිය 2023.10.29 වන දින උදෑසන කාලයේ නමුණුකුල පොලිස් වසමේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 38 ක් වන තැන්නේකුඹුර, නමුණුකුල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ග්‍රෑම් 26 මිලිග්‍රෑම් 360 ක් බර උණු කරන ලද රන් ගුලියක් සොයා ගෙන ඇත. ඉතිරි රන් භාණ්ඩ මූල්‍ය ආයතනයක් වෙත උකස් තබා ඇති බවට තොරතුරු අනාවරණය වී ඇති අතර වව්නියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ගල්ගමුව පොලිස් වසම.

2023.10.29 වන දින උදෑසන කාලයේ ගල්ගමුව පොලිස් වසමේ පාදෙණිය අනුරාධපුර මාර්ගයේ කුරුන්දන්කුලම ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට පාදෙණිය දෙසට ධාවනය වූ මෝටර් රථයක් මාර්ගය හරහා ධාවනය වූ යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු සහ පසු පැදිකරු ගල්ගමුව රෝහලට ඇතුලත් කිරීමේදී පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 78 ක් වූ කුරුන්දන්කුලම, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගල්ගමුව මහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් මෝටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**